මාලිම්බඩ ප්‍රාදේශීය සභාව - මාලිම්බඩ
மாலிம்பட பிரதேச சபை - மாலிம்பட
MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA

දු.ක./ෆැක්ස් தொலைபேசி/ தொலைநகல் Telephone / Fax:- 041-2240208

මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-
දිනය :- 2023.03.01
திகதி :-
Date :-

# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
# 2023.02.09 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
- ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
- ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
- ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
- ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
- ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
- ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි මස මාසික සභා රැස්වීම 2023.02.09 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.30 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

## *01. පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.*

2023.01.04 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීම.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

## *02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන*

විමලවංශ මන්ත්‍රීතුමා 2022/12/02 සභාව නීති විරෝධි ලෙසට ලියුමක් දීපු නිසා ඒකේ නීත්‍යානුකූලභාවය පිළිබඳ සොයා බලන්න අපි යැව්වා පළාත් පාලන කොමසාරිස්තුමාටත් සහකාර කොමසාරිස්තුමාටත්.ඒ අනුව අපිට නිර්දේශ ලබා දීලා තියනවා.2022/12/02 වන දින පැවැත් වූ විශේෂ සභා රැස්වීමේදී යෝජනා අංක 5:2 සිට 5:11 දක්වා ඊළඟ සතියේ විශේෂ සභාවකට කල් තැබීම 1988 ප්‍රාදේශීය සභා රැස්වීම් කරගෙන යාම කාර්ය පටිපාටිය ප්‍රාදේශීය සභා රීති මඟින් ප්‍රතිපාදන සපයා දී නොමැති බවත් 2022.12.09 දින පැවති විශේෂ සභා රුස්වීමට ඉදිරිපත් කර ඇති 5:2 සිට 5:11 දක්වා යෝජනා රීති ප්‍රකාරව ඉදිරිපත් වී ඇති බැවින් එම රැස්වීම නීත්‍යානුකූල බවත් සඳහන් කර ලිපියක් එවලා තියනවා.විමලවංශ මැතිතුමාටත් ලිපියක් ඇවිල්ලා එවලා තියනවා.

***03.සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවන ලද "සරුසාර මාතොට සංවර්ධන වැඩසටහන ii අදියර,ආදර්ශ ගොවිපලවල් දෙකක් ආරම්භ කිරීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ශක්ති,මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය,ඇල්ගිරිය, දයා දික්මාදුගොඩගේ විසින් එවන ලද "පෙර පාසල් ගොඩනැගිල්ල සම්බන්ධව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- නො 29,රුහුණු සෙවන,කුරුදුවත්ත,එච්.ආර්.කේ.අනෝමා විසින් එවන ලද "ඉඩම හා නිවස නාය යෑම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවන ලද "පළාත් පාලන ආයතන වලට ඉඩම් නිදහස් කරගැනීම සම්බන්ධව - මාලිම්බඩ ප්‍රාදේශීය සභාව " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ඩබ්.කේ.ඩසිංක උදයංග මහතා විසින් ඉදිරිපත් කරන ලද"ගැඩවිල් දියර පොහොර හා ඝන පොහොර ව්‍යාපෘතිය ජනවාරි මස ආදායම්/වියදම් (පුනරාවර්ථන හා ප්‍රාග්ධන) වාර්තාව "යන හිසින් යුත් ලිපිය සභා ගත කරන ලදී.
- අඹගහගොඩ මාර්ගය ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කරන ලද"පැරණි ගම් සභා කාර්යාලයට පිවිසෙන මාර්ගය පිළිසකර කිරීම "යන හිසින් යුත් ලිපිය සභා ගත කරන ලදී.
- මල්ෂා නිවස, ගමගෙගොඩ,ඇල්ගිරිය,තෙලිජ්ජවිල,සී.ධනුෂ්ක මධුෂාන් විසින් එවන ලද "දිලෙන තරු කලායතනය පවත්වාගෙන යාම සඳහා ස්ථානීය අවසරය ලබා ගැනීම"යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- සංවර්ධන නිලධාරී එච්.බී.ගනේෂා ගීතානි මිය විසින් ඉදිරිපත් කරන ලද"කොම්පෝස්ට් ව්‍යාපෘතිය මාලිම්බඩ ප්‍රාදේශීය සභාව 2023 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

***04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**<u>යෝජනා අංක 5:1</u>**

2022/12/22දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:1**
2022/12/22දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 5:2**
2022.12.30 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

**තීරණ අංක 5:2**
2022.12.30 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:3**
2023.01.04 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:3**
2023.01.04 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:4**
2023.01.18 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:4**
2023.01.18 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:5**
දැනට ක්‍රියාත්මක කිරීමට අනුමත කර ඇති සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කල පසු ඉතිරි මුදල ආදාහනාගාරය ඉදි කිරීම සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අකුරැස්ස ශාඛාවේ ස්ථාවර තැම්පත් ගිණුමට හෝ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

ඉහත යෝජනාව විශේෂ සභාවකට හෝ මහ සභාවකට කල් තබන ලදී.

**<u>යෝජනා අංක 5:6</u>**

මාලිම්බඩ වෙළද සංකීර්ණයේ අංක 03 කඩ කාමරයේ වර්තමාන බදු අයිතිකරු වන මෝටින් විදානපතිරණ මයාගෙන් බදු අයිතිය ඉවත් කර එහි බදු අයිතිය අයි.කේ මහේෂ් කුමාර යන අයට පැවරීම සුදුසු බවටත් එහි එක්වන් මුදල ලෙස මාසික බදු මුදල මෙන් සිය ගුණයක් හෝ මහා සභාව විසින් තීරණය කරන ලද මුදලක් අය කර ගැනීමට සුදුසු බවටත් පවරා ගැනීමේදී අය කරනු ලබන මාස 03ක ආරක්ෂක ඇප මුදල හා ආපසු නොගෙවන තැන්පතු ලෙස අය කල යුතු මුදල කඩ ගිවිසුම් හා අදාල වක්‍ර ලේඛණය පරිදි සිදු කිරීමට සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

කාරක සභාවක් බවට පත් කිරීමට

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

මහා සභාවක් බවට පත් කිරීමට
යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>තීරණ අංක 5:6</u>**

මාලිම්බඩ වෙළද සංකීර්ණයේ අංක 03 කඩ කාමරයට සදහා නව තක්සේරුවක් ලබා ගැනීමටත් එම තක්සේරුව ලැබීමෙන් පසු ඉදිරි සභාවකට ඉදිරිපත් කර කඩ කාමරය පැවරීම සම්බන්ධව කටයුතු කිරීමටත් තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:7</u>**

මාලිම්බඩ වෙළද සංකීර්ණයේ අංක 11 කඩ කාමරයේ වර්තමාන බදු අයිතිකරු වන ඊ.එම්.සිරිසේන මයාගෙන් බදු අයිතිය ඉවත් කර එහි බදු අයිතිය ඩී.රණවීර මියට පැවරීම සුදුසු බවටත් එහි එක්වන් මුදල ලෙස මාසික බදු මුදල මෙන් සිය ගුණයක් හෝ මහා සභාව විසින් තීරණය කරන ලද මුදලක් අය කර ගැනීමට සුදුසු බවටත් පවරා ගැනීමේදී අය කරනු ලබන මාස 03ක ආරක්ෂක ඇප මුදල හා ආපසු නොගෙවන තැන්පතු ලෙස අය කල යුතු මුදල කඩ ගිවිසුම් හා අදාල වක්‍ර ලේඛණය පරිදි සිදු කිරීමට සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

**<u>තීරණ අංක 5:7</u>**

මාලිම්බඩ වෙළද සංකීර්ණයේ අංක 11 කඩ කාමරයට සදහා නව තක්සේරුවක් ලබා ගැනීමටත් එම තක්සේරුව ලැබීමෙන් පසු ඉදිරි සභාවකට ඉදිරිපත් කර කඩ කාමරය පැවරීම සම්බන්ධව කටයුතු කිරීමටත් තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:8</u>**

මාලිම්බඩ රණවිරු ගම්මානයේ කාණු පද්ධතිය සකස් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය

<u>තීරණ අංක 5:8</u>
මාලිම්බඩ රණවිරු ගම්මානයේ කාණු පද්ධතිය සකස් කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**6. යථා පරිදි කල් දී නොමැති යෝජනා.**

<u>යෝජනා අංක 6:1</u>
කටුවන්ගොඩ ගංකන්ද මාර්ගය,ගල්ගෙඩිය අසල පදිංචි නිලූකා ජයසිංහ මහත්මිය විසින් මාර්ගයට බාධා වන ලෙස ඉදිකර ඇති මායිම් තාප්පය පිළිබඳව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

කාරක සභාවක් බවට පත් කිරීමට
යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

මහා සභාවක් බවට පත් කිරීමට
යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

<u>තීරණ අංක 6:1</u>
කටුවන්ගොඩ ගංකන්ද මාර්ගය,ගල්ගෙඩිය අසල පදිංචි නිලූකා ජයසිංහ මහත්මිය විසින් මාර්ගයට බාධා වන ලෙස ඉදිකර ඇති මායිම් තාප්පය පිළිබඳ ස්ථානීය පරීක්ෂණයකින් පසුව නීත්‍යානුකූල පියවර ගැනීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

<u>යෝජනා අංක 6:2</u>
වෙනිඅකුල ආයුර්වේද සායන මධ්‍යස්ථානයේ සේවය කරන ඩබ්.ඩී.මධූෂා කුමාරි මියගේ 2022 වර්ෂය සඳහා සේවා කාලය අවසන් බැවින් 2023 වර්ෂය සඳහා සේවා කාලය දීර්ඝ කිරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

<u>තීරණ අංක 6:2</u>
වෙනිඅකුල ආයුර්වේද සායන මධ්‍යස්ථානයේ සේවය කරන ඩබ්.ඩී.මධූෂා කුමාරි මියගේ 2022 වර්ෂය සඳහා සේවා කාලය අවසන් බැවින් 2023 වර්ෂය සඳහා සේවා කාලය දීර්ඝ කිරීමට සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

<u>යෝජනා අංක 6:3</u>
වාර්ෂික ගබඩා හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුමත කිරීම හා පහත නම් සඳහන් නිලධාරීන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ මණ්ඩලය හා වෙන්දේසි කිරීමේ මණ්ඩලය ලෙස පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- සෝමසිරි වීරමන් මයා - සභාපති
- එච්.එච්.අසංකා කුමාරි මිය - ලේකම්
- එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
- අංජලිකා උදයන්ති මිය - තාක්ෂණ සේවා නිලධාරී
- එම්.ඒ.කසුන් සමීර මයා - තාක්ෂණ සේවා නිලධාරී
- අශාරා පියුමිණී මිය - ආදායම් පරීක්ෂක
- එන්.කරුණානායක මයා - කළමණාකරණ සේවා නිලධාරී

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**

වාර්ෂික ගබඩා හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම හා පහත නම් සඳහන් නිලධාරීන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ මණ්ඩලය හා වෙන්දේසි කිරීමේ මණ්ඩලය ලෙස පත් කිරීම සුදුසු බවට තීරණය විය.

- සෝමසිරි වීරමන් මයා - සභාපති
- එච්.එච්.අසංකා කුමාරි මිය - ලේකම්
- එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
- අංජලිකා උදයන්ති මිය - තාක්ෂණ සේවා නිලධාරී
- එම්.ඒ.කසුන් සමීර මයා - තාක්ෂණ සේවා නිලධාරී
- අශාරා පියුමිණී මිය - ආදායම් පරීක්ෂක
- එන්.කරුණානායක මයා - කළමණාකරණ සේවා නිලධාරී

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:4</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික සේවක මහතා අසනීප වීම හේතුවෙන් වෙනත් ප්‍රාදේශීය සභාවකින් විදුලි කාර්මික සේවක මහතෙකු ගෙන්වා කොට්ඨාශයේ අක්‍රීය විදුලි පහන් අලුත්වැඩියාව සිදු කිරීමටත් එම සේවක මහතාට නියමිත ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික සේවක මහතා අසනීප වීම හේතුවෙන් වෙනත් ප්‍රාදේශීය සභාවකින් විදුලි කාර්මික සේවක මහතෙකු ගෙන්වා කොට්ඨාශයේ අක්‍රීය විදුලි පහන් අලුත්වැඩියාව සිදු කිරීමටත් එම සේවක මහතාට නියමිත ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීමටත් තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:5</u>**

මාලිම්බඩ පොදු වෙළඳපොළ,මාලිම්බඩ ප්‍රාදේශීය සභා නව කාර්යාලය හා මාලිම්බඩ වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම සඳහා මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් එවා ඇති MLB/LND/GENER/L4/57 අංක දරණ 2023.01.12 දිනැති ලිපිය අනුව මිනින්දෝරු කාර්යාලය මඟින් පිඹුරක් ලබා ගැනීම සඳහා අදාල මුදල වන රු.34500.00ක මුදල මාතර දිස්ත්‍රික් මින්දෝරු කාර්යාලය වෙත ගෙවීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

මාලිම්බඩ පොදු වෙළඳපොළ,මාලිම්බඩ ප්‍රාදේශීය සභා නව කාර්යාලය හා මාලිම්බඩ වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම සඳහා මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් එවා ඇති MLB/LND/GENER/L4/57 අංක දරණ 2023.01.12 දිනැති ලිපිය අනුව මිනින්දෝරු කාර්යාලය මඟින් පිඹුරක් ලබා ගැනීම සඳහා අදාල මුදල වන රු.34500.00ක මුදල මාතර දිස්ත්‍රික් මින්දෝරු කාර්යාලය වෙත ගෙවීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:6</u>**

වීදි පහන් නඩත්තුව සඳහා දෛනිකව නිකුත් කරන බල්බ් 15 වෙනුවට බල්බ් 30ක් දෛනිකව නිකුත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

**<u>තීරණ අංක 6:6</u>**

වීදි පහන් නඩත්තුව සඳහා දෛනිකව නිකුත් කරන බල්බ් 15 වෙනුවට බල්බ් 30ක් දෛනිකව නිකුත් කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙකු ලෙස කටයුතු කල කළ්‍යාණ අබේසිංහ මැතිතුමා පසු ගිය දිනක අභාවප්‍රාප්ත වීම හේතුවෙන් නිම්නා අබේසිංහ අතුරලියගෙවත්ත,හොරගොඩ තෙලිජ්ජවිල යන ලිපිනයට ශෝකය ප්‍රකාශ කර ලිපියක් යැවීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙකු ලෙස කටයුතු කල කළ්‍යාණ අබේසිංහ මැතිතුමා පසු ගිය දිනක අභාවප්‍රාප්ත වීම හේතුවෙන් නිම්නා අබේසිංහ අතුරලියගෙවත්ත,හොරගොඩ තෙලිජ්ජවිල යන ලිපිනයට ශෝකය ප්‍රකාශ කර ලිපියක් යැවීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:8</u>**

කොම්පෝස්ට් ඒකකයෙහි කොම්පෝස්ට් හැලීම සඳහා භාවිතා කරන යකඩ දැල නැවත සැකසීමේ කාර්යය සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම,තීරණ ගැනීම හා පිරිවිතර තීරණය කිරීම ආදී කටයුතු සිදු කිරීම සඳහා පහත නිලධාරීන්ගෙන් යුත් තාක්ෂණික කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- චන්ද්‍රතිලක මයා - ප්‍රධාන කලමණාකරණ සේවා නිලධාරි

- කසුන් සමීර මයා - තාක්ෂණ සේවා නිලධාරී
- අංජලිකා උදයන්ති මිය - තාක්ෂණ සේවා නිලධාරී

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>තීරණ අංක 6:8</u>**

කොම්පෝස්ට් ඒකකයෙහි කොම්පෝස්ට් හැලීම සඳහා භාවිතා කරන යකඩ දැල නැවත සැකසීමේ කාර්යය සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම,තීරණ ගැනීම හා පිරිවිතර තීරණය කිරීම ආදී කටයුතු සිදු කිරීම සඳහා පහත නිලධාරීන්ගෙන් යුත් තාක්ෂණික කමිටුවක් පත් කිරීමට තීරණය විය.

- චන්ද්‍රතිලක මයා - ප්‍රධාන කලමණාකරණ සේවා නිලධාරි
- කසුන් සමීර මයා - තාක්ෂණ සේවා නිලධාරී
- අංජලිකා උදයන්ති මිය - තාක්ෂණ සේවා නිලධාරී

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:9</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ cctv කැමරා සවි කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම,තීරණ ගැනීම හා පිරිවිතර තීරණය කිරීම ආදී කටයුතු සිදු කිරීම සඳහා පහත නිලධාරීන්ගෙන් යුත් තාක්ෂණික කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

- සභාපති - ආචාර්ය සුබෝධ ගුණවර්ධන මයා
  ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය(විදුලි හා තොරතුරු සන්නිවේදන,ඉංජිනේරු පීඨය,ගාල්ල,හපුගල)
- සාමාජික - බී.ඒ.එස්.සාරංග මයා (ඉංජිනේරු,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,මාතර)
- සාමාජික - කසුන් සමීර (තාක්ෂණ නිලධාරී,මාලිම්බඩ ප්‍රාදේශීය සභාව)

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>තීරණ අංක 6:9</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ cctv කැමරා සවි කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම,තීරණ ගැනීම හා පිරිවිතර තීරණය කිරීම ආදී කටයුතු සිදු කිරීම සඳහා පහත නිලධාරීන්ගෙන් යුත් තාක්ෂණික කමිටුවක් පත් කිරීම සුදුසු බවට තීරණය විය.

- සභාපති - ආචාර්ය සුබෝධ ගුණවර්ධන මයා
  ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය(විදුලි හා තොරතුරු සන්නිවේදන,ඉංජිනේරු පීඨය,ගාල්ල,හපුගල)
- සාමාජික - බී.ඒ.එස්.සාරංග මයා (ඉංජිනේරු,පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,මාතර)
- සාමාජික - කසුන් සමීර (තාක්ෂණ නිලධාරී,මාලිම්බඩ ප්‍රාදේශීය සභාව)

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:10</u>**

2021.05.11 මාසික සභාවේදී තීරණ අංක 5.5 යටතේ ගන්නා ලද සභා තීරණය අනුව පාරට මායිම්ව ඉදි කරන ඕනෑම තාප්පයක් අඩි 2ක් පසුපසට ගෙන ඉදි කළ යුතු බවට තීරණය වී ඇත.එමනිසා අයිරින් පෙරේරා මහත්මිය විසින් පාරට මායිම්ව ඉදි කිරීමට සැලසුම් කර ඇති මායිම් තාප්පය ද ගන්නා ලද සභා තීරණය අනුව අඩි 2ක් පස්සට ගෙන ඉදි කළ යුතු බවට අදාළ පාර්ශවය දැනුවත් කර ලිපියක් යැවීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**තීරණ අංක 6:10**
2021.05.11 මාසික සභාවේදී තීරණ අංක 5.5 යටතේ ගන්නා ලද සභා තීරණය අනුව පාරට මායිම්ව ඉදි කරන ඕනෑම තාප්පයක් අඩි 2ක් පසුපසට ගෙන ඉදි කළ යුතු බවට තීරණය වී ඇත.එමනිසා අයිරින් පෙරේරා මහත්මිය විසින් පාරට මායිම්ව ඉදි කිරීමට සැලසුම් කර ඇති මායිම් තාප්පය ද ගන්නා ලද සභා තීරණය අනුව අඩි 2ක් පස්සට ගෙන ඉදි කළ යුතු බවට අදාළ පාර්ශවය දැනුවත් කර ලිපියක් යැවීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:11**
වසර 50කට වැඩි කාලයක් තිස්සේ භාවිතා කරන ලද වීරමන් මාවත දෙවන හරස් මාර්ගය ප්‍රාදේශීය සභාවේ මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීමටත් ගැසට් කිරීමටත් යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**තීරණ අංක 6:11**
වසර 50කට වැඩි කාලයක් තිස්සේ භාවිතා කරන ලද වීරමන් මාවත දෙවන හරස් මාර්ගය ප්‍රාදේශීය සභාවේ මාර්ගයක් ලෙස ලියාපදිංචි කිරීමටත් ගැසට් කිරීමටත් තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:12**
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවන දායක මුදල් ඔන්ලයින් ක්‍රමවේදය යටතේ යැවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

**තීරණ අංක 6:12**
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවන දායක මුදල් ඔන්ලයින් ක්‍රමවේදය යටතේ යැවීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:13**
ප්‍රාදේශීය සභා මාර්ග වල ගමන් ගන්නා බර වාහන වල උපරිම බර ප්‍රමාණය කියුබ් 2ක් විය යුතු බවටත් ඒ පිළිබඳ ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ජනතාව දැනුවත් කිරීමටත් අදාළ මාර්ග වල බෝඩ් සවි කිරීමටත් සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා

**තීරණ අංක 6:13**
ප්‍රාදේශීය සභා මාර්ග වල ගමන් ගන්නා බර වාහන වල උපරිම බර ප්‍රමාණය කියුබ් 2ක් විය යුතු බවටත් ඒ පිළිබඳ ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ජනතාව දැනුවත් කිරීමටත් අදාළ මාර්ග වල බෝඩ් සවි කිරීමටත් තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

7) **කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

8) **ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

9) **වෙනත් කරුණු**

<u>**ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා**</u>
සියලු දෙනාගෙන් අවසරයි.සභාපතිතුමනි,ඇල්ගිරිය පහල කියාඩුව ප්‍රජා ශාලාවේ පවත්වන්න ඉල්ලීම් කරන දිලෙන තරු කලායතනය පිළිබඳ ග්‍රාම නිළධාරීතුමා සමග කතා කලා එතුමගේ විරුද්ධත්වයක් නෑ.නමුත් මේ ග්‍රාම නිළධාරී වසමේ සියලුම සමිති සමාගම් පවත්වන්නෙ මේ ප්‍රජා ශාලාවේ.එතකොට ප්‍රජා ශාලාව ඇතුලෙ තියන සමිති වල පුටු මේස ආදී භාණ්ඩ වලට වගකියන්නේ කවුද කියන ගැටලුව තියනවා.අපි පෙර පාසල් වලටත් බද්දක් අය කරනවා.ඒ නිසා එතන මුදල් වලට නැටුම් පන්තියක් පවත්වනවා නම් බද්දක් අය කරන්න වෙනවා.ග්‍රාම නිලධාරීතුමාගෙ විරුද්ධත්වයක් නෑ.එතුමා කියලා තියනවා එහෙම ප්‍රජා ශාලාවේ යතුර දෙන්න බෑ සභාපතිතුමාගෙන් ලිඛිත ලියවිල්ලක් අරන් එන්න කියලා.ප්‍රජා ශාලාව දෙනවනම් දෙන්න වගකීමෙන් මාව නිදහස් කරන්න.

<u>**ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා**</u>
ගරු සභාපතිතුමනි,වීධි පහන් නඩත්තුව සම්බන්ධව දිගින් දිගටම මේ සභාව තුළ කතා කලා.මේක අපි ලේකම්තුමියගෙනුත් ඉල්ලීමක් කලා දක්ෂ පරිපාලන නිලධාරිතුමියක් ඉන්නෙ.අපි ඉල්ලනවා මේක නිවැරදි වෙයි කරන්න කියලා.සුල්තානාගොඩ වැව ළගට එනවා පසුගිය දවසක ලයිට් හදන්න.වැව ළඟ තිබුණු ලයිට් එකත් පිච්චිලා.ඊට අල්ලපු කනුවත් පිච්චිලා.එකකට පැමිණිල්ල දාලා තියනවා.ඒක හැදුවා.හතර පස්දෙනෙක් එකතු වෙලා කියලත් වැව ළඟ ලයිට් එක හැදුවෙ නෑ බඩු ගෙනැල්ලා නෑ කියලා.අපි ක්‍රමවේදයක් හදලා දීලා තියනවා.වසර කිපයක් ඒ විදියට ගලාගෙන ආවා.මේක නිලධාරීන් අතර තියන ප්‍රශ්නයක් වෙන්න පුළුවන්.ඉහල නිලධාරියාට පහල නිලධාරියා විශ්වාස නැති වෙන්න පුළුවන්.මෙතනින් බල්බ් 20ක් නිකුත් කරනවා නම් ඇප්ලිකේෂන් 20ක් දෙන්න කියලා වැඩපිලිවෙලකුත් හැදුවා.ඒ අදාල කනුව භාර ගෙදරකට හෝ කඩයකට අපි භාර දීලා තියනවා.ඒ භාර දීපු කෙනාගෙන් කරපු අලුත්වැඩියාව පිළිබඳව අත්සනක් දෙන්න කියලා දැනුවත් කරලා තියනවා.ඒ කාරණා සියල්ල එහෙම තියෙද්දි අපි අදාල සේවකයාගෙන් ඇහුවම ඇයි හැදුවෙ නැත්තෙ ඇයි කියලා එක්කො පැමිණිල්ලක් දාලා නෑ කියනවා.එක්කො බඩු දෙන්නෙ නෑ කියනවා.ගමේ මිනිස්සු ඕවා දන්නෙ නෑ.මං යද්දි මාව නවත්තලා ඇහුවා ඇයි මන්ත්‍රීතුමා එහෙම වෙන්නෙ කියලා.හැමෝම දේශපාලඥයාට ඇඟිල්ල දික් කරනවා.නිලධාරි කරන වැරද්ද දකින්නෙ නෑ.වැව ළඟ ලයිට් එක හදන්න අදටත් ඇවිල්ලා නෑ.හෙට ඇවිල්ලා ඕකට පැමිණිල්ල දැම්මම බඩු ටික පටවගෙන වාහනේ තෙලුත් ගහගෙන ආයෙ සුල්තානාගොඩ යන්න ඕන.සුල්තානාගොඩ මාලිම්බඩ සභාවෙ කෙලවරම තියෙන්නෙ.මං කියන්නෙ එහෙම යනකොට මඟ තියන ලයිට් හදන් යන්න පුළුවන්නෙ.ඒකනේ විය යුත්තෙ.එහෙම තමා ආයතන වලට ආදරේ නිලධාරීන් කරන්නෙ.තමන්ට තියන රාජකාරිය මොනා හරි කරලා කට්ට පැනලා ගිහින් වැඩ කරන්න.ඒක ඉහල නිලදාරියාගෙ උපදෙස් මතද කියන්න අපි දන්නෑ.ලයිට් 20ක් පිච්චිලා තියනකොට ලයිට් 5ක් 6ක් හදල එනවා.පැමිණිල්ලක් දාන්න බැරි වෙන්න පුළුවන්.කනුවෙ ලයිට් එක පිච්චුනාම කඩවල් වල ඉන්න මිනිස්සු සභාවේ නම්බර් එක දන්නේ නෑ.මන්ත්‍රීවරු විදියට අපි වසමෙ පිච්චුනු ඔක්කොම ලයිට් ගැන දන්නෙ නෑ.අධික වැස්සක් තිබුණොත් ලයිට් 10ක් 15ක් පිච්චෙනවා.වසමෙ නිලධාරියටත් පුළුවන් ටිකක් හොයලා බලන්න.මිනිස්සු ලොකු දේවල් බලාපොරොත්තු වෙන්නෙ නෑ.පාර කැලේ වෙලානම් සුද්ද කරලා දෙන්න කියලා සභාවට කියන්නෙ.අඳුරු තැනක ලයිට් දාලා දෙන්න කියනවා.මොකද පාරෙ තියන ලයිට් එක මිනිස්සුන්ට ප්‍රයෝජනවත්.ලයිට් හදන්න යන දවසට කොහොම හරි ඒක දෙන්න.වීදි පහන් මිලදී ගන්නකොට අපි ඒ සියලුම දේවල් වලට අනුමැතිය දීලා තියනවා.හැබැයි ගමට යන්නෙ මුන්ට ලයිට් එකක්වත් දාගන්න බැරි නම් මොකටද සභාවට යවන්නෙ කියලා.මෙතන නිලධාරින්ගෙ වැඩපිලිවෙල මිනිස්සු දන්නෑ.අපි

දේශපාලනේ කරන්නෙ ගම්වල ඡන්ද කාලෙට විතරයි.සමහර අය චෝදනා කරනවා දැන් පිරිසිදු අය එක පැත්තක දැන් අපිරිසිදු අය එක පැත්තක කියලා.පක්ෂ විපක්ෂ හැමෝම දන්නවා අපි මේ සභාවේ හැසිරෙන්නෙ කොහොමද කියලා.මං අවුරුදු 20දි මේ සභාවට ආවේ.ඒ වෙද්දිත් සුපෝගබෝගී මෝටර් රථයක් මං පාවිච්චි කලේ.අපි දේශපාලනයෙන් හම්බ කරගත්ත මිනිස්සු නෙවෙයි දේශපාලනයට ඇවිල්ලා තිබුණු දේවල් නැති කරගත්තා.මේ සභාවේ කිසි කෙනෙක්ට ඇඟිල්ල දික් කරන්න බෑ.වැරද්දක් වුණොත් පක්ෂ විපක්ෂ කවුරුත් ඒක පෙන්නලා දුන්නා.අපි හැමදාම කතා කලේ මිනිස්සුන්ගෙ යහපත වෙනුවෙන්.හැබැයි ඒක මිනිස්සු අතරට ගියේ නෑ.දේශපාලඥයාට පොදුවේ දික් කරන ඇඟිල්ල තමයි හැමදාම දික් කරන්නේ.වීදි පහන් ප්‍රශ්නය ක්‍රමවත් කරන්න සභාපතිතුමා ඒ තුළින් අපි ලොකු දෙයක් දකිනවා.සභාවට ඒකවත් කරගන්න බෑ කියන එක මිනිස්සුන්ගෙ තියනවා.සමහර නිලධාරීන් දේශපාලන කුහකත්වය එක්ක රාජකාරී කරන අවස්ථා අපි දැකලා තියනවා.ඒ දේවල් වලින් අපි අපහසුතාවයට පත්වෙනවා.මං මන්ත්‍රීවරුන්ටත් කියන්නෙ මේ ජරා දේශපාලනය කරන්නෙ නැතුව මිනිසුන් වෙනුවෙන් සේවය කරන්න බැදෙමු කියන ඉල්ලීම කරමින් නිහඬවෙනවා ස්තූතියි.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

සභාවේ පසුගිය දින කීපය තුළ වාහනයක් තිබුණෙ නෑ.ඩීමෝ බට්ටා රථය තමයි තිබුණේ.ඒ වාහනය තමයි මේ දවස්වල හැමදේකදිම භාවිතයට ගන්න සිද්ද වුණේ.ඒ කාරණය එක්ක වීදිපහන් නඩත්තුව යම් ප්‍රමාද වීමක් වෙන්න ඇති මොකද අවශ්‍යතාවයට රථය නැවත කැඳවන නිසා.ඒක එක හේතුවක්.අනිත් කාරණාව විදුලි කාර්මික ශිල්පියා මේ දිනවල අසනීප වෙලා ඉන්න නිසා මේ දවස් කීපය ඒ කටයුතු සිද්ද වුණේ නෑ.ඒ නිසා මං අතුරලිය සභාවෙ සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළා දින දෙකක් විදුලි කාර්මික ශිල්පියා ලබා දෙන්න කියලා වීදි පහන් නඩත්තු කටයුතු සිදු කරන්න.සුල්තානාගොඩ ප්‍රශ්නෙ මං දන්නවා හදිසි අවස්ථාවක් වෙලා මං ගෙන්න ගත්තා ඩීමෝ බට්ටා.මේ ප්‍රශ්නෙ අපි නිවැරදි කරගන්නවා.

<u>ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා</u>

සියලුම දෙනාගෙන් අවසරයි.සභාපතිතුමනි,අපේ සභාවේ හිටපු සභාපතිතුමා පසුගිය දිනක අපි හැරදා මලවුන් අතරට එකතු වුණා.එතුමා සමඟ මාලිම්බඩ සභව තුළ කටයුතු කරපු මන්ත්‍රීවරු දැනට දෙන්නයි ඉන්නෙ.මං හිතන්නෙ සභාපතිතුමත් විමලවංශ මන්ත්‍රීතුමත් විතරයි.2001දිත් හිටිය කියලා සමන් මන්ත්‍රීතුමා කියනවා මට ඒ ගැන මතකයක් නෑ.හොඳයි කොහොම වුණත් එතුා හැම නිතරම සිනා මුසු මුහුණින් බොහෝ දෙනාගේ හිත් දිනා ගනිමින් කටයුතු කළා.ඒ වගේම හොරගොඩ මූලික කරගෙන මාලිම්බඩ ප්‍රාදේශීය සභාව ජනතාව අතරට නොගියපු කාල වකවානුව තුළ තමන්ගේ කාර්ය භාරය නිසි ලෙස ඉෂ්ට සිද්ධ කලා.එතුමාගේ අවසන් කටයුතු වෙලාවේ මට සම්බන්ධ වෙන්න බැරි වුණා මං ගමේ හිටියෙ නෑ.ඒ වුණත් උදේ පාන්දර 3ට පමණ උදයසාන්ත මන්ත්‍රීතුමා මට කතා කලා ඒ වෙලාවෙම මං ඒ නිවසට ගිහින් නීත්‍යානුකූලව දේහය නිදහස් කරගැනීමේ කටයුතු වෙනුවෙන් අපිට පුළුවන් ආකාරයට සහයෝගය ලබා දුන්නා.ඒ සියල්ල උදේ 5 6 වෙනකොට ඒ කටයුතු සියල්ල සිද්ධ කරා. තෙලිජ්ජවිල තමයි කලින් ප්‍රාදේශීය සභාව තිබුණේ.මං සා/පෙළ විභාගය ඉවර වෙලා ප්‍රතිඵල එනකන් බලන් ඉන්න බැරි නිසා සභාවට ඇවිත් ඇහුවා මොකක් හෝ වැඩක් කරන්න තියනවද කියලා.ඒ වෙලාවේ මාර්ග කම්කරුවෙක් විදියට මං බඳවා ගත්තා.මං කාලයක් එතුමා එක්ක වැඩ කරා.එතුමා අපිට බොහොම ආදරය කලා.ඒ වගේම අද වගේ නෙවෙයි හරියට වැඩ කරලා තමන් උපයන මුදලට හරියන්න කටයුතු කරන්න එතුමා අපිට ඉගැන්නුවා.ඒ නිසා එතුමා අපිට ගුරුවරයෙක්.ඒ විතරක් නෙවෙයි කොමිනිස්ට් පක්ෂය තරුව ලකුණින් තරඟ වැදිලා දේශපාලනයට එතුමා අවතීර්ණ වුණා.මිය යන තෙක්ම තමන්ගේ දේශපාලන ගමන වෙනස් නොකර ඒ තුළම ඉඳගනිපු සැබෑ වාමාවාදියෙක්.ජනතා ප්‍රශ්න හඳුනාගෙන ඒවට විසඳුම් ලබා දෙන්න ජනතාවගෙ යටිතල පහසුකම් දිනා දෙන්න බොහොම උත්සහයෙන් කටයුතු කළා.ඒ වෙලාවෙ අපේ සභාපතිතුමා ශෝකය ප්‍රකාශ කරන්න ඇති.මමත් මේ වෙලාවේ සමස්ථ මාලිම්බඩ ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරනවා.ඒ වගේම ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වනවා ගරු මන්ත්‍රීතුමාලා හා නිලධාරින් දැනුවත් කරලා එතුමාගේ දේහය මෙහි තැම්පත් කරලා එතුමාට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගෞරවය ලබා දෙන්න අවස්ථාව ලබා දීම සම්බන්ධව.අවසාන වශයෙන් අපේ අබේසිංහ හිටපු ගරු සභාපතිතුමාණන්ට උතුම් වූ නිවන් සුව ලැබේවායි මං ප්‍රාර්ථනා කරනවා.

ගරු මන්ත්‍රී පිටිදුව ගමගේ විමලවංශ මහතා

සියලුම දෙනාගෙන් අවසරයි.සභාපතිතුමනි,මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මමත් වර්තමාන සභාපතිතුමාත් කල්‍යාණ අබේසිංහ මැතිතුමාත් 1991 සිට 1997 දක්වා කටයුතු කලා.ඔහුගේ පියත් ගම්මුලැදෑනි කෙනෙක් විදියට හිටියේ.හොරගොඩ ප්‍රදේශයේ ඉතාම වැදගත් පවුලක පුද්ගලයෙක් විදියට මං දකිනවා.අබේසිංහ මහත්මයා දේශපාලනයට එන්න පෙර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් විදියට වැඩ කලා.ඊට පස්සෙ වාමාංශික දේශපාලන කඳවුර නියෝජනය කරමින් දේශපාලනයට පිවිසි ඔහුට මාක්ස්වාදය, සමාජවාදය පිළිබඳ හසල දැනුමක් තිබුණා.ඒ වගේම ඔහු පොත පත කියවීමට ඉතාම උනන්දුවක් තිබූ පුද්ගලයෙක්.එහු තුළ මාක්ස්වාදී ගතිගුණ බොහෝ සෙයින් තිබුණා.ඒ වගේම ඔහු කිසි වෙලාවක එම මාක්ස්වාදී කඳවුරෙන් ඉවත් වුණේ නෑ.යම් යම් කලකිරීම් තිබුණත් ලොකුවටම දේශපාලනයෙන් ඉවත් වුණේ නෑ.ඒක මං හොඳ ගතිගුණයක් විදියට දකිනවා.ඒ වගේම සභාපතිවරයා විදියට ඔහු මන්ත්‍රීවරුන්ට ඇහුම්කන් දීපු මන්ත්‍රීවරුන්ගෙ ඉල්ලීම් වලට ගරු කරපු මිනිසුන් සමඟ සුහදශීලීව කටයුතු කරපු අයෙක්.දේශපාලන වශයෙන් වෙනස් මත දැරුවත් මිනිසුන්ගෙ පැත්තෙන් එන යෝජනා වලට ගරු කලා.ඒ නිසා පුද්ගලයෙක් විදියට ආත්ම ගරුත්වයක් සහිතව එම තනතුරේ කටයුතු කලා.එවැනි පුද්ගලයෙක් වර්තමාන දේශපාලනයට අහිමි වීම පිළිබඳ මං කණගාටු වෙනවා.මොකද ඒ කාලේ සභාපති තනතුර බොහොම ගෞරවනීය ලෙස හැසිරෙව්වා.ඒ කාලේ මේ සභාවේ වාහනයක්වත් තිබුණෙ නෑ.එතුමා සභාපති වෙලා අවුරුදු 3ක් විතර ගියාට පස්සෙ තමයි වාහනයක් ලැබුණෙ සභාවට ප්‍රේමදාස මහත්මයා ජනාධිපති වුණාට පස්සෙ.එතකන් පෞද්ගලික වාහනය පාවිච්චි කලා.මුල් යුගය ඉතාම දුෂ්කර යුගයක් මේ වගේ පහසුකම් තිබුණෙ නෑ.මාර්ග කම්කරුවො වුණත් 3ක් හෝ 4ක් හිටියේ.ඒ කාලේ ප්‍රාදේශීය ලේකම්වරයා තමයි සභාවේ ලේකම් විදියට කටයුතු කලේ.ඒ කාලය තුළ ප්‍රාදේශීය ලේකම්වරයා සමඟත් ගැටුමක් ඇති නොවන විදියට ඉතාම සුහදශීලීකව කටයුතු කලා.75ක් පමණ වන එතුමාගේ ජීවිත කාලය පුරාවට මාලිම්බඩ කොට්ඨාශයට ඉතාමත් ලොකු සේවයක් කලා.දේශපාලනය සමාජ සේවයක් ලෙස ගෙන කටයුතු කලා.එවැනි පුද්ගලයෙක්ගෙ සමුගැනීම සමාජයට ඉතාම පාඩුවක්.අවසාන වශයෙන් එතුමාණන්ට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

සියලු දෙනාගෙන් අවසරයි.සභාපතිතුමනි,කල්‍යාණ අබේසිංහ මැතිතුමා මගේ ඥාතිවරයෙක් විදියට එතුමාගේ ජීවිතයේ බොහෝ දේ මං දන්නවා.නොයෙක් දුක් ගැහැට වලින් පත්නරය ලබලා මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ පළමු සභාපති විදියට විශාල සේවයක් මාලිම්බඩ ප්‍රදේශයට කරා.මං අහලා තියනවා එතුමා සභාපති ධූරය දරපු කාලය තුළ තමන්ගෙ සීනුව වාද නොකර ඒ අදාළ නිලධාරියා ළඟටම ගිහින් තමන්ගෙ තනතුර ගැනවත් හිතන්නෙ නැතුව කටයුතු කලා.ඉතාම සුහදශීලීව කටයුතු කරපු පුද්ගලයෙක්.ඔහුගේ අභාවය සිදු වුණේ මීට දින කීපයකට කලින් පාන්දර 3ට විතර.මං ඒ වෙලාවෙම සභාපතිතුමාට කතා කලා එතුමගෙ දුරකතනය ක්‍රියා විරහිත කරලා තිබුණෙ.මං උපසභාපතිතුමාට කලා කලාම එතුමා ඒ වෙලාවෙ ඇවිත් ලොකු සේවයක් කලා ඒ කරපු කැප වීමට උපසභාපතිතුමාට මම ස්තූතිවන්ත වෙනවා. ඒත් එක්කම මරණ පරීක්ෂණ කටයුතු වෙනුවෙන් ඉතා සුළු වෙලාවක් තිබුණේ.ඒ සියලු දේවල් පවුලේ අයගේ විරෝධයක් තිබුනා අවසන් ගෞරව දක්වන්න දේහය සභාවට ගෙන ඒම සම්බන්ධව නමුත් ඒ වගකීම මම අරගෙන කෙටි වේලාවකදී ඒ කටයුත්ත කරල දෙනවා කියන පොරොන්දුව පිට සභාපතිතුමාත්, මන්ත්‍රී මණ්ඩලයත් එකතුවෙලා සභාවට දේහය ගෙන ඒමට කටයුතු කලා මුලදි විරුද්ධ වුනත් පස්සෙ ඔවුන් තේරුම් ගත්තා ඒ හරහා අබේසිංහ මැතිතුමාට ලොකු ගෞරවයක් ලැබුණු බව.කෙටි කාලයක් තුළ සංවිධානය කරලා ඒ කටයුතු සිදු කිරීම පිළිබඳව ඥාතිවරයෙක් විදිහට සභාපතිතුමාටත්, උප සභාපතිතුමාටත්, මන්ත්‍රී මණ්ඩලයටත් කාර්යය මණ්ඩලයටත් මම මේ වෙලාවෙ ස්තූති වන්ත වෙනවා.හැබැයි එක පැත්තකින් කණගාටුවටත් පත්වෙනවා.එතුමා තනතුරේ ඉද්දි තමයි එතුමාගේ මව්තුමිය අභාවයට පත්වුනේ.අපිට මතකයි මුළු භූමියම දැන්වීම් වලින් පිරුණා.පක්ෂයේ දැන්වීම්ම 10ක් 15ක් විතර තිබුණා.නමුත් කණගාටුදායකයි එතුමාගේ අභාවය වෙනකොට සභාවේ බැනර් එකවත් යොදාගන්න බැරි වුණා.අපිටත් මේක පොදුයි.කෙනෙක් තනතුරේ ඉන්නකොටයි

නැතිකොට ලැබෙන ගෞරවයයි වෙනස්.අපිත් මේක තේරුම් ගන්න ඕන කාරණාවක්.ඒ පිළිබඳ මගේ දුකක් කණගාටුවක් තියනවා.ඒත් එක්කම සභාපතිතුමා දේහය ගෙනාපු එකට නිලධාරින් අකමැතියි කියලා යම් යම් තොරතුරු තියනවා.මං හිතන්නෙ එහෙම වියයුතු නැහැ.අපි හැමෝම මරණයට පත්වෙනවා.ඒ වගේම මරණයකදි දෙන ගෞරවය ඉතාම වැදගත් දෙයක්.කවුරුහරි ඒක දෝෂදර්ශනයට ලක් කරනවා නම් ඇත්තටම ඒ ගැන කණගාටුයි.දේහය සභාවට ගෙනැල්ලා කරපු ගෞරවයට මා නැවතත් ස්තූතිවන්ත වෙනවා.ඥාතිවරයෙක් විදියට එතුමාට ශෝකය ප්‍රකාශ කල බව ලිඛිතව දැන්වීමත් ඉතාම සුදුසු දෙයක්.එහෙම කරන්න කියලා ඉල්ලීමකුත් කරමින් අවසාන වශයෙන් හිටපු සභාපති කළ්‍යාණ අබේසිංහ මැතිතුමාට අමා මහ නිවන් සුව අත්වේවායි ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>
අවසරයි.සභාපතිතුමනි,මට මතකයි අපි සභාවට එනකොට අපිට කලින් කළ්‍යාණ අබේසිංහ මැතිතුමා 1991 පලවෙනි සභාපතිවරයා හැටියට තෙලිජ්ජවිල මාලිම්බඩ ප්‍රාදේශීය සභාව පිහිටවලා තමන්ගෙන් ජනතාවට ඉෂ්ට වෙන්න ඕන යුතුකම් වගකීම් සියල්ල ඉෂ්ට කරලා තියනවා.මේ අවස්ථාවේ එතුමාගේ අභාවය වෙනුවෙන් පවුලේ අයට ඥාතීන්ට හිතවතුන්ට සියලු දෙනාටම අපේ සංවේගය පුද කරන්න ඕන. මට මතකයි අපි මුලින්ම සභාවට 2002 එනකොටත් එතුමා තේරී පත්වුණා.දෙවනි වතාවට ඥාණසිරි මැතිතුමා සභාපති ධුරය දැරුවා.2002දි තමයි තුන්වෙනි සභාවෙදි අපි සභාවට ආවේ.එතකොට කපිල ගමගේ මැතිතුමා සභාපති වුණේ.ඒ වෙලාවෙත් විපක්ෂ මන්ත්‍රීවරයෙක් හැටියට අපිත් එක්ක කටයුතු කලා.ඇත්තටම එතුමාට දැනුම් සම්භාරයක් තිබුණා.යම්කිසි දෙයක් කරනකොට නිහතමානී ලෙස එතුමා දන්න දේ කියා දුන්නා.ඒ අවස්ථා වලදී බොහොම සහයෝගයෙන් වැඩ කරන්න අපට ශක්තියක් වුනා. අපි එයට ගෞරව කරන්න ඕන දේශපාලනය තුළ නැති කාලය තුලත් අපේ හොඳ මිත්‍රයෙක් හැටියට එතුමා දන්න දේවල් හදිස්සි අවස්ථාවලදී අපට කියා දීල තියනවා.මොකද මගකදී හෝ හමුවුනාම සුහදව කතා කරලා දේශපාලන කටයුතු කොහොමද කියලා අපෙන් විස්තර අහල තියනවා.තමන් දන්න දේ කියල දීලා කෙනෙක් හරි මඟ යවන්න පක්ෂ පාට භේදයක් නෑ.එතුමා ඒ විදිහට කටයුතු කලා අපි ඒ ගෞරවය එතුමාට දෙන්න ඕන. අපි වෙන වෙනම පක්ෂ නියෝජනය කලත් කාගෙත් අදහස මාලිම්බඩ උපදින දරුවාගේ පටන් මිය යන වැඩිහිටියා තෙක්ම නිසි සේවාවක් කරන්න ඕන කියන එක.ඒක හැමෝටම හිතට එන්නෙ නෑ.මහජන මෙහෙවරට කැපවෙන සියලුම දේශපාලන නායකත්වයට ගෞරව කරන්න ඕන.තමන්ගෙ පෞද්ගලික ප්‍රශ්න පැත්තකින් තියලා ප්‍රදේශයේ ජනතාවට යම් කිසි සේවයක් කරන්න ඉදිරිපත් වෙන එක ලොකු සේවයක් විදිහට මම දකිනවා.පක්ෂ භේදයකින් තොරව එය අගේ කරන මොහොතක කළ්‍යාණ අබේසිංහ මැතිතුමා අප අතරින් වෙන්ව ගියා කියන පුවත ඇසුණු ගමන්ම සභාපතිතුමා හමුවෙන්න ඇවිල්ලා මම කිව්වේ අවශ්‍ය කටයුතු සූදානම් කරන්න අපේ පූර්ණ සහයෝගය දෙනවා කියලා.එය විය යුතුමයි. මිය ගියාට පස්සෙ වුවත් ජනතා සේවය වෙනුවෙන් කරපු සේවයට ගෞරව කළ යුතුයි.මොන පක්ෂෙද පාටද කියල අදාල නෑ.මාලිම්බඩ මේ තත්වයට දියුණු කරන්න එතුමාගේ කැප කිරීම ඉවහල් වෙලා තියනවා.දේහය සභාවට ගෙනැල්ලා කරපු ගෞරවයට සභාපතිතුමාටත් අනෙක් සියලු දෙනාටත් ගෞරවනීය ස්තූතිය පුද කරන ගමන් උදයසාන්ත මැතිතුමා කිව්ව වගේ ලිඛිතවත් ලිපියක් යවන්න ශෝකය ප්‍රකාශ කරලා.ඒ වගේම එතුමාට නිවන්සුව ප්‍රාර්ථනා කරනවා.

ඒත් එක්කම පළාත් පාලන මැතිවරණය ඇවිල්ලා තියනවා.අපේ හිටපු මන්ත්‍රීවරු එක්කෙනෙක් හැර සියලුම දෙනා අපේක්ෂකයො හැටියට ඉදිරිපත් වෙලා තියනවා. තරංගා මන්ත්‍රීතුමියට ස්තූතිවන්ත වෙනවා මේ කාල සීමාව තුළ කාන්තා නියෝජනයක් මෙහෙයවමින් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් දීපු සහයෝගය පිළිබඳව අනෙක් සියලුම මන්ත්‍රීවරු දේශපාලන පිටියට ඇවිල්ල තියනවා.එක එක්කෙනාගෙ කැමැත්ත ගන්න සමත්වීම තුළ තමයි ප්‍රාදේශීය සභාවට එන්නෙ.ගිය වසර පහ තුළ ඒ ආපු සියලු දෙනා තමන්ගෙ කාලය, ශ්‍රමය, ධනය කැප කරමින් සුවිශේෂී වූ කාර්යයක් ඉටු කලා.මාලිම්බඩ ප්‍රාදේශීය සභාව තුළ යම්කිසි සේවාවක් මිනිස්සුන්ට කරන්න අපෙන් විය යුතු දායකත්වය දෙන්න ශක්තිමත් වැඩ පිළිවෙලක් ගෙන යන මන්ත්‍රීතුමාලා හා තුමියන්ලා හැටියට ඒකෙ ගෞරවය විපක්ෂ නායකවරයා හැටියට මං මේ වෙලාවෙ ස්තූතිවන්ත වෙනවා.මම හිතන්නෙ

දැන් ඉදිරිපත්වෙලා ඉන්න සියලුම මන්ත්‍රීවරු තමන්ගෙ දායකත්වය තුළින් ගමනක් යනවනම් අපට ප්‍රශ්නයක් නෑ.ඒ ගමන යන්න මේ සියලුම දෙනාට ශක්තිය ලැබෙන්න ඕන කියන දේ සඳහන් කරමින් මා නිහඬවනවා.ස්තුතියි.

<u>ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා</u>
ගරු සභාපතිතුමනි,ඇත්තටම කළ්‍යාණ අබේසිංහ මැතිතුමා ජීවත්ව සිටින කාලේ ලෙන්ගතු පුද්ගලයෙක් වගේම සභාපති විදිහට වැඩ කරන කාලේ විශාල මෙහෙයක් ගමට ප්‍රදේශයට කරා. ඒ ගැන අපි ආඩම්බර වෙනවා මේ සභාවේ හිටපු සභාපති වශයෙන් මෘත දේහය සභාවට ගෙනැල්ලා අවසන් ගෞරව දැක්වීම සම්බන්ධයෙන් සභාපතිතුමා ඇතුළු සියලු දෙනාටම ස්තුතිවන්ත වනවා.වමේ දේශපාලනයේ අපිත් එක්ක සැමදා එකට හිඳිමින් කටයුතු කරපු සාධාරණ පුද්ගලයෙක්.සභාවට මුල් කාලයේ මේ වගේ දේපලක් තිබුනෙ නෑ.යාන වාහන නැති කාලේ මාර්ග කම්කරුවෝ දාලා වැඩ කරද්දි කම්කරුවෝ දෙතුන් දෙනයි හිටියෙ.නමුත් කොන්ත්‍රාත් පදනම මත එක්කෙනෙක් දෙන්නෙක් අරගෙන කාණු හාරලා ගම වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරා.කළ්‍යාණ අබේසිංහ මැතිතුමාට ආදර නාමයෙන් කියන්නෙ කළු අබේ කියලා ඉතින් එතුමාණන්ට නිවන්සුව ප්‍රාර්ථනා කරමින් නිහඬවනවා ස්තුතියි.

<u>ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා</u>
සභාපතිතුමා ඇතුලු සියලුම දෙනාගෙන් අවසරයි. අපේ කළ්‍යාණ අබේසිංහ මැතිතුමා සභාපති ධූරය දරණ කාලේ අපි පාසල් ශිෂ්‍යයෝ විදිහට හිටියත් මෑත කාලයේ අපට හමුවන හැම වෙලාවකම බොහෝ ඇසූ පිරූ තැන් සහ බොහොම පිරිසක් ආශ්‍රය කරන කෙනෙක් විදිහට බොහොම නිහතමානී විදිහට දේශපාලන අත්දැකීම්,ජීවිතයේ රසබර තැන් බෙදා ගන්න අපිත් එක්ක එතුමා ක්‍රියා කලා.උදයසාන්ත මන්ත්‍රීතුමා මතු කරපු කාරණය එක්ක දේශපාලඥයා ගෞරවයට ලක්විය යුතු කෙනෙක් වුවත් බොහෝ නින්දාවට ලක්වන තත්වයට වර්තමානයේ පත්වෙලා තියෙනවා.ඒකෙ එක දෙයක් වෙන්න ඇති සභාවට ගෙන ඒමත් ගෞරවය නිසි පරිදි නොලැබීමත්.එතුමාණන් බොහොම ගෞරවයෙන් මේ වෙලාවෙ සිහිපත් කරනවා මොකද මට මතකයි ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ අපේක්ෂකත්වය හිමිවෙලා මොකද කරන්නෙ කියලා අදහසක් නැතිව ගෙදරට වෙලා ඉද්දි මාව හොයාගෙන ගෙදරටම ඇවිත් පුතේ අපි මොකක් හරි තැනකින් පටන්ගමු කියලා මට මිනිස්සුන්ට කතා කරන්න අවස්ථාවක් හදල දීලා මගේ පළවෙනි රැස්වීම මගේ ගෙදරදී සංවිධානය කරන්න පළමු පියවර ගත්තෙ එතුමා.මම ඡන්දෙ ඉල්ලනවා කියලා මිනිස්සුන්ට කතා කරපු දවසෙ මගේ ලඟින් ඉදලා අවශ්‍ය උපදෙස් වගේම ඊට පසුවත් යම් යම් තැන් වලට දේශපාලන වශයෙන් විවිධ උපදෙස් ලබා දුන්නා.ඒ පිළිබඳ ඉතාම ගෞරවයෙන් සිහිපත් කරන ගමන් එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා පක්ෂයේත් ගෞරවය සහ ශෝකය ප්‍රකාශ කරන්න මෙය අවස්ථාවක් කරගන්නවා.

අපේ විපක්ෂ නායක තුමා මතු කරපු කාරණය ලොකුවටම කතාවෙන මාතෘකාවක්.පළාත් පාලන ඡන්දය ඇවිල්ල තියනවා අපේ සියලුම මන්ත්‍රීවරු ඒ වෙනුවෙන් මැතිවරණයට සූදානම් වෙමින් ඉන්නවා.නමුත් අපි දැක්කා මේ රටේ මිනිස්සු විවිධ ක්‍රම වලින් මාධ්‍ය හරහා සමාජ මාධ්‍ය, අරගල හරහා දේශපාල සංස්කෘතියේ වෙනසක් තමයි බලාපොරොත්තු වෙන්නෙ.ඒ වෙනස ඕන කියලා අපිටත් දැනෙන්න ගත්තා.පසුගියකාලෙ සිද්ධි එක්ක අරගෙන බලනකොට හදවතේ තියනවා රටේ දේශපාලන ක්‍රමයෙ වෙනසක් වෙන්න ඕන කියලා.එසේ ඉල්ලීමක් තියෙද්දිත් තාමත් පේනවා පසුගිය කාලෙ තිබුණු මජර තක්කඩි දේශපාල සංස්කෘතිය නැවතත් දේශපාලන කරලියේ රඟ දැක්වෙමින් තියන බව. චෝදනා මඩ ගැසීම් සමාජ මාධ්‍ය හරහා දියත්වෙනවා.ඇත්තටම මට මේ ළඟදි කෙනෙක් කීවා ලංකාවෙ දේශපාලනය හොඳයි ඉගෙන ගන්න නමුත් එය භාවිතා කරන්න යන්න එපා කියලා. දේශපාලනය තමයි ලංකාවෙ තියන එකම විෂය ඉගෙන ගන්නෙ එකක් ක්‍රියාත්මක වෙන්නෙ තව එකක් දේශපාලන විෂය ගත්තම හරබර රසවත් විෂයක්.පළාත් පාලන පනත ගත්තත් හරි ආසයි නවකතාවක් වගේ කියවන්න.නමුත් ඒව ක්‍රියාත්මක වෙද්දි ලොකු ප්‍රශ්ණයක් තියනවා. නමුත් අපි ආධුනික මන්ත්‍රීවරු විදිහට මෙතනට එනකොට ප්‍රාදේශීය සභාවක් අවුරුදු තුනක් විතර තිබුනෙ නැති තැනකට අපි ආවෙ.සම්පූර්ණ වෙනස්.එකෙ අත්දැකීම් ගත්තෙ අවුරුද්දක් දෙකක් යනකොට.සමහර නිලධාරීන් වැඩ කළේ විවිධ අරමුණු ඔලුවෙ තියාගෙන.පනතෙ

තියෙන්නෙ එකක්.වෙන්නෙ තව දෙයක්.අපි එන්නෙම දේශපාලනය බොරුවක් කියාගෙනම.නමුත් අපි ඇවිල්ල කරන්නෙ අර තක්කඩි වැඩේම තමයි.මම හිතන්නෙ අපේ මන්ත්‍රීවරු එහෙම වෙන්න ඕන නෑ.සමන් මන්ත්‍රීතුමා කියපු විදියට පක්ෂ විදිහට විවිධ හැල හැප්පීම් ආවා.නමුත් තමන්ගෙ කාර්ය භාරය තමන්ට පුලුවන් විදිහට කරන්න උත්සාහ ගත්තා. තර්ක කලා.හැප්පුනා ප්‍රශ්න ගෙනාවා.මන්ත්‍රීවරු සියලු දෙනාටම මගේ හෘදයාංගම සුභාශිංෂන පුදකරනවා.ඒ වගේම අපේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය දීපූ සහයෝගයට ස්තුතිවන්ත වෙනවා.එතුමිය ඇතුලු කාර්ය මණ්ඩලයට සුභපතනවා මැතිවරණයෙන් පස්සෙ වෙනස්වීම දරාගන්න ධෛර්ය ශක්තිය ලැබෙන්න කියලා.මේ තියන තත්වය සමහරවිට වෙනස් වෙයි වැඩකරනකොට.නිලධාරීන් කියන්නෙ ඇත්තටම නීති අනපනත් චක්‍රලේඛ සමඟ වැඩ කරන්නෙ.දේශපාලනය ෆුල්ටයිම් කරන් නෑ කවුරුත් තව දෙයක් කරන ගමන් තමයි දේශපාලනය කරන්නෙ.අපි තීන්දු ගන්නෙ මිනිස්සුන්ගෙ ප්‍රශ්න එක්ක.ප්‍රතිපත්තිමය තීන්දු තීරණ.නිලධාරීන් තීන්දු ගන්නෙ වෙනස් විදිහට.ඔය දෙක සමාන කරගන්නෙක තමයි ඇත්තටම මෙතන තියෙන්නෙ.අපේක්ෂකත්වයට තරඟ කරන සියලුම මන්ත්‍රීවරුන්ට මම සුභ පතනවා ස්තුතියි.

<u>ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය</u>

සියලුදෙනාගෙන් අවසරයි.සභාපතිතුමණි, නැගිටින් නෑ කතා කරන් නෑ කියල හිත හිතා හිටියත් ආයෙ මෙතනට ඇවිල්ලා කතා කරන්න වේ දෝ නොවේදෝ කියල හිතුන නිසයි නැගිට්ටෙ.පළමුවෙන්ම ඉතාම කණගාටුදායක හදිසි මරණයක් තමයි අපේ අබේසිංහ මාමගේ මරණය.මම දැනගත්තෙ මුලින්ම සුරේෂ් ගමගේ දොස්තර මහත්තය තමයි මට මුලින්ම විස්තරේ කිව්වෙ.අබේසිංහ මාමා මැරිල කියලා මට පුදුම හිතුන ඊයෙ හවසත් මට ෆෝන් එක ගහගෙන ගියානෙ කියලා.මටත් වඩා මගේ පවුලේ හිතවතෙක් අබේසිංහ මාමා වර්තමාන දේශපාලනය ගැන කතා කරද්දි මමත් තරඟ කරන්න ඉන්න තරඟකාරිණියක් වෙලත් මම පැත්තකට වෙලා ඉන්නකොට අපේ කඩේට ඇවිල්ලා ඇහුවා ඇයි දූවේ එළියට බහින්නෙ නැද්ද කියලා ඇහුවා.ඉතින් මාමෙ කොහොමද එළියට බහින්නෙ කියල මම කිව්වා.එහෙම කරන්න එපා හැමෝම දූවනවා අපිත් මේක කොහොමහරි කරමු කියලා අබේ මාමා කිව්වා. අපිත් මේ සභාවෙ අනන්ත කතා කරනවා අබේසිංහ සභාපතිතුමාගේ කාලේ මෙහෙම වුනා කියලා.නමුත් ඒ ගෞරවය මෙතෙනින් එළියට ගියාට පස්සෙ තියනවද කියලා ගැටලුවක්. අබේසිංහ මැතිතුමාගේ දේහය සභාවට ගෙනාපු වෙලාවෙ මට ඊට සහභාගීවෙන්න බැරිවුනා. මගේ පෞද්ගලික අපහසුතාවයක් නිසා මගේ සැමියාගේ පියා මේ වන විටත් බොහොම අසාධ්‍ය තත්වයේ ඉන්න.මාලිම්බඩ සභාවේ ප්‍රථම සභාපතිතුමා විදිහට නියම ගෞරවය දුන්නද කියලා මටත් ගැටලුවක්.අපි එහෙම විය යුතු නෑ.ගරු සේවයක් අපි මේ කරන්නෙ.හිටපු කාලය තුළ ඒක සිද්ද කලේ බොහොම ආඩම්බරයෙන්.එතනින් එහාට ඒ ගරුත්වය නැති වෙන්නෙ අපේ ක්‍රමයේ වරදක් ද නැත්නම් වෙන දෙයක්ද කියල කියන්න දන්නෙ නෑ.රටේ තත්වයේ වැරද්දක් තියනවා.එහෙම විය යුතු නැති සභාපතිවරයෙක්ට මන්ත්‍රීවරයෙක්ට එහෙම වුනාම අවංකවම කණගාටුවක් තියනවා.ඒ තත්වයට වඩා වෙනස් තත්වයක් අපට ඉදිරියේදි උදාවේවි. කළු අබේමාමා කියන චරිතය එක්ක මම දේශපාලනික සට්ටනයක් ඇතිකරගෙන නැහැ.මං එතුමගෙ දේශපාලනය ගැන කතා කරන්න දන්නෙත් නැහැ.මං දන්නෙ එතුමා කොමිනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරියෙක් කියල විතරයි ගිය අවුරුද්ද වෙනකොටත් දකුණු පළාතේ මාතර දිස්ත්‍රික් කොමිනිස්ට් පක්‍ෂ සංගමයේ ප්‍රධාන සාමාජිකයෙක් වෙලා හිටියා.නමුත් ඒ පක්ෂෙනුත් එතුමාගේ අවසාන අවස්තාවට ලොකු ගෞරවයක් දුන්නද කියලා මට හිතාගන්න බැරි වුනා.මොකද වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමත් මම තමයි සම්බන්ධ කරලා දුන්නෙ කොහොමහරි මෙතනට සහභාගී වෙන්න එන්නම ඕන මරණයක් කියලා.ඒ කැප කිරීම වෙනුවෙන් වීරසිංහ මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒත් එක්කම මම කියන්න කැමතියි අපි හැමෝම එකතුවෙලා හොඳ කිව්වා ඇත්තටම හොඳ මනුස්සයෙක් මරණය දැන ගත්තම උදේ 6.00 ට විතර මම මගේ ෆේස්බුක් පිටුවේ සටහනක් තිබ්බා මම ඒකෙ කිව්වෙත් මේ හැමදේටවත් වඩා බොහොම ලෙන්ගතු සිනාවක් ඇති එතුමගෙ අභාවය දාරාගන්න අමාරුයි කියලා.

මැතිවරණ සමයක් එන්නෙ.ඇත්තටම මං කියන්න කැමතියි අප සියලුදෙනාම එකට හිටිය වගේ තරංගා මන්ත්‍රීතුමිය හැර අනෙක් සියලු දෙනා මාර්තු 09 තියන පොරපිටියට වැටිලා

තියනවා.මං පසුගිය දවසක මොහොට්ටි මන්ත්‍රීතුමා එක්ක කිව්වෙත් අයියෙ අපි මේ කරන වැඩේ මොකද්ද මිනිස්සු මෙච්චර එපා කියද්දිත් ඇයි අපිට තරහ කරන්න වෙලා තියෙන්නෙ කියලා.අපට යම් වැරදීමක් වෙලා තියනවනම් ඒක හදාගෙන ඉදිරියට යමු අපි කොච්චිර කෑගැහුවත් හැමදාමත් ඇඟිල්ල දික්කරන්නේ දේශපාලඥයාට හැමෝම කියන්නෙ 225 ක් ගැන නමුත් අපි හදවතට තට්ටු කරල බැලුවොත් රාජ්‍ය සේවකයොත් වග කියන්න ඕනෙ.මමත් රාජ්‍ය සේවකයෙක් මේ ගොඩක් අය එහෙමයි.අපි හදවතට තට්ටු කරල අහමු අපි ඒ ගන්න පඩියට අවංකවම සේවය කරනවද කියලා.දේශපාලඥයා විතරද හැමදේටම වැරදි. තීන්දු තීරණ ගන්න තැන විතරද වැරැද්ද තිනේනෙ.හදවතට තට්ටු කරල ඇහුවොත් අපිටත් හිතන්න දෙයක් නෑ මේ තියන තත්වෙට මිනිස්සු තමයි වැරදි. මිනිස්සු අවශ්‍යතා සම්පූර්ණ කරගන්න හිත් සතුටු කරගන්න කරන්නා වූ දේවල අවසානය නිසා තමයි මේ තැනට පත්වෙලා තියෙනනෙ.නමුත් අපි හරි ලේසියට කියනවා දේශපාලඥයා හොරා කෑවා හොරා කෑවා කියලා.හොර කන්න ඇති මං නෑ කියන්නෙ නෑ.අපි ඡන්දෙ පාවිච්චි කරන්න ගියාම ඒ කතිරය හරියට ලකුණු කරනවද ඇයි මං ඡන්දෙ දෙන්නෙ කියලා මෙතුවක් කාලෙකට කල්පනා කරලා තියනවද.අපේ තාත්තා එක්සත් ජාතික පාක්ෂිකයෙක්.කැපුවත් කොළපාට මනුස්සයෙක්.පසුගිය දිනවල මං කල්පනා කලා මං ගත්ත තීරණ හරිද කියලා කල්පනා කරගෙන යනකොට මට තේරුම් ගියා මං වැරදි නෑ කියලා.මේ වෙලාවෙත් මං ඉන්නෙ මහා සැඩපහරක උඩුගම්බලා පීනන තත්වයක නමුත් මම බය නෑ කාන්තාවක විදිහටවත් බය නෑ මං දකින දේශපාලනය තුළ මම උත්සාහ කරනව.මොහොට්ටි මන්ත්‍රීතුමා එක්කත් මං කතා කලා මේ සභාවෙ හිටියත් නැතත් මිනිස්සු ආත්මාර්ථකාමී නොවී තමන් ගැන විතරක් නෙමෙයි මේ රටට ජාතියට මොකක් වේද කියන තැනට ඒ ගහන කතිරය ගහන මනුස්සයාගේ දේශපාලන සාක්ෂරතාවය වර්ධනය කරන්න පුලුවන් මිනිස්සු ගේන්න මේ සමාජයේ ජීවත්වන පුද්ගලයෙක් විදිහට මං උත්සාහ කරනවා.මිනිස්සුන්ට උගන්නවා ඇයි අපි ඡන්දය දෙන්න ඕන කියනෙක ගොඩක් මිනිස්සු කියනවා අපි මේ සැරේ ඡන්දෙ දෙන්නෙ නෑ.කාට දුන්නත් එකයි කියලා.සමාවෙන්න මම මේ පක්ෂ වල නම් කියනවට කලින් අපි දැක්කා ප්‍රවාහය වගේ පොහොට්ටු ආවා මහින්ද මහත්තයගෙ පින්තූරය දැකලා ඒ වගේ මේ සැරේ ප්‍රවාහයක් මාලිමාවට තියනවා මගේ සහෝදරය තරහවෙන එකක් නැහැ එහෙම කියනවට. මිනිස්සු කොහොමද එහෙම තීරණ ගන්නෙ නමුත් ඒ කියන කතා වගේ නෙවෙයි කරන කතා ඡන්ද පෙට්ටිය ළඟට ගියාම මං පළවෙනිපාර සභාවට එනකොට ගෙදර හිටපු ගෘහනියක් මම පනත් කෙටුම්පත් මුදල් රෙගුලාසි සේරම කියවල ආවෙ.ඇත්තටම අර කිව්ව වගේ කියවන්නත් ආස හිතුනා.ඒකෙ තියන දේවල් මෙතනට ආවට පස්සෙ තමයි මොකද්ද වෙන්නෙ කියලා ඉගෙන ගත්තෙ.සමහර දේවල් අදටත් තේරුම් ගන්න බෑ. ඇත්තටම වෙන සභා වලට වඩා මාලිම්බඩ සභාව හොදයි කියලා මම හිතනවා මොන මොන අභ්‍යන්තර ගැටුම් ආවත් සාමුහික තීරණ ගන්න කණ්ඩායමක් විදිහට අපි එකට හිටියා දේශපාලන වශයෙන් විවිධ තීරණ වල ඉන්න ඇති ගැටුම් ඇති කරගන්න නැතුව වැඩ කටයුතු කරගෙන යන්න දේශපාලන වාතාවරණයක් සභාවෙ තිබුණා ඇත්තටම විමලවංශ මන්ත්‍රීතුමාට,සමන් මන්ත්‍රීතුමාට මං ගරු කරනවා නවකයො වශයෙන් ගොඩක් ඉගෙනගන්න දේවල් තිබුණා. මගේ ජීවිතේ ලොකු අත්දැකීමක් ගත්ත තැනක් තමයි මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.මේ සුහදතාවය හිතවත්කම මැතිවරණ ප්‍රචාරණ කටයුතු වලදීත් දේශපාලන ඉදිරි ගමනේදීත් තියාගෙන ඉදිරියට යමු කියලා හැමෝටම සුභ පතනවා අවසාන වශයෙන් කළු අබේමාමාට භවගාමී සසරේ පතන්නාවූ ඉක්මන් භවයකදී නිවන්දුව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා</u>

සභාපතිතුමනි,කල්‍යාණ අබේසිංහ හිටපු සභාපතිතුමාගේ අවමංගල්‍ය අවස්ථාවට කොමිනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය වීරසිංහ සහෝදරයා සහභාගී වුණා.ඇත්ත පුවත්පතේ කතෘ ජිනදාස සහෝදරයා සහභාගී වුණා.ඒ ඇතුළුව දේශපාලන මණ්ඩලයේ තවත් දෙදෙනෙකුත් ඇතුළුව මධ්‍යම කාරක සභාවේ13ක් සහභාගී වුණා.ඒ එක්කම වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමාට ප්‍රථමයෙන්ම අභාවය පිළිබඳ දැනුවත් කලේ මමයි.මන්ත්‍රීතුමිය බොරු ප්‍රකාශ කරනවා ඒ ගැන කණගාටුයි.

<u>ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා</u>

සභාපතිතුමනි,ඇත්තටම හොරගොඩ ප්‍රධාන මාර්ගයේත් භාග්‍යගමහා අනෙකුත් ප්‍රෙද්ශ කිහිපයකම ජලනල එලීම සිදුවෙනවා.ප්‍රජා ජල ව්‍යාපෘතිය හරහා ජලය ලබා දෙන ජලනල සේරම කැඩිලා ගිහින් තියනවා.භාග්‍යගමට වතුර නෑ සතියකින්.හැබැයි කොන්ත්‍රාක්කරුවන් කියන්නෙ මේකට අපිට මුදලක් ලැබෙන්නෙ නෑ ඒ නිසා අපිට මේ ක්‍රමවේදයට පිටින් වැඩ කරන්න බෑ කියලා.නමුත් සභාපතිතුමනි දැනට පුධාන මාර්ගයේ ජලනල සම්බන්ධ නොකර තමයි මේ ජලනල එලීම සිදුකරන්නෙ.ඒ නිසා ඔබතුමා දුරකථනයෙන් කතා කරනවට වඩා මේක ප්‍රායෝගිකයි ප්‍රජා ජල සමිතියත්,ජල සම්ප්‍රාධනයත්,කොන්ත්‍රාත්කරුවොත්,ඔබතුමාලත් නියෝජනය වෙලා එක තැනකට මේ සාකච්ඡාව අරන් දෙන්න එතකොට අපිට ඒක නිවැරදි කරගන්නෙ කොහොමද කියලා සාකච්ඡා කරල ස්ථිර විසඳුමකට යමු කියලා යෝජනා කරනවා.මේක විසඳුමකට යා යුතුයි.තවත් මාර්ග කීපයක් ඇතැරිලා තියනවා.ඒ ටිකත් විසඳගන්න පුළුවන් ඒ සාකච්ඡාවෙදි නිවැරදිව කරුණු දැනගත්තොත්.ඉතා ඉක්මණින් දිනයක් ලබා ගෙන මේ හමුව ලබා දෙන්න කියලා ඉල්ලීම කරනවා.ඒ වගේම මීට පෙර උපසභාපතිතුමා හිටපු සභාවෙදි ඉදිරිපත් වුණු කාරණා දෙකක් මේ වනතෙක් නිවැරදි වුණෙ නැහැ.එකමුතු මාවතේ පස් ඉවත් කිරීම මුදල් අද වෙනකන් ගෙවා ගන්න බැරි වෙලා තියනවා.ඒ වගේම හොරගොඩ ප්‍රජා ශාලාවේ විදුලිය ලබා ගැනීමට මොහොට්ටි මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අදටත් ක්‍රියාත්මක වෙලා නෑ.එතුමා ඊට පහුවදාම කිව්වා ඒක කරනවා කියලා නමුත් ඒක අදටත් වෙලා නෑ කියන කාරණාවපුකාශ කරමින් ඒ ගැන ඉක්මන් කටයුත්තක් කරන්න කියලා ඉල්ලීම කරමින් නිහඬවනවා ස්තූතියි.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මයා</u>

මන්ත්‍රීවරුනි,හිටපු සභාපතිතුමාගෙ අභාවය පිළිබඳව සියලු දෙනාම අදහස් ප්‍රකාශ කලා.මගේ අදහස නම් මිනිසෙක් මැරුණම කරන වර්ණනාවෙන් වැඩක් නෑ.ජීවත්ව ඉද්දි කරන වර්ණනාව තමයි ඒ පුද්ගලයාට තියන මානසික සුවය අබේසිංහ මහත්මයා ජීවත්ව ඉන්න කාලේ මේ අදහස් ප්‍රකාශ වුණේ නෑ.අන්න ඒක තමයි අපේ වැරැද්ද.අපි වුණත් මැරුණම සේවය අගයනවා.ඉන්නකන් අගයන් නෑ.දේශපාලන පක්ෂ ආදියෙන් බැලුවම ඒවා යටපත් වෙලා යනවා.කාටත් ඒක පොදුයි.වරදක් නැතත් වරදක් හදලා හරි උඩට මතුකරලා දෙනවා.ඒ තමයි සමාජෙ තියන වැරදි දෘෂ්ටිකෝණය.අබේසිංහ මහත්තයා ගැන මං බොහෝ දේ දන්නවා.භීෂණ කාලේ එතුමාගේ නිවස විනාශයට පත් වුණා.ඒ විතරක් නෙවෙයි 1987 ප්‍රාදේශීය සභා පනත ගෙනාපු වෙලාවේ 1988 තමයි ප්‍රාදේශීය සභාව පවත්වන්න තිබුණෙ.එදා මරණ බියක් තිබුණා.ඒකත් එක්ක කොමිනිස්ට් පක්ෂයේ මමත් අබේසිංහ මහත්මයත් විතරයි නාම යෝජනා භාර දුන්නෙ.අනෙකුත් පක්ෂ ඉදිරිපත් වුණේ නෑ.ඒ නිසා 1988 පවත්වන්න තිබුණු මැතිවරණය 1991ට ගියා.එතුමා මොන මැර තර්ජන තිබුණත් ඒ කිසිම දේකට බය නැති පුද්ගලයෙක්. ඒ අවස්ථාවට ප්‍රභූවරු සහභාගී වුණා.හිටපු අමාත්‍ය එච්.ජී.සිරිසේන මැතිතුමා,කොමිනිස්ට් පක්ෂය වෙනුවෙන් පක්ෂයේ ඉහළ නිලධාරී මණ්ඩලය,ප්‍රධාන ලේකම්තුමා,ප්‍රදේශයේ ප්‍රභූවරු,මන්ත්‍රීවරු ආවා.නමුත් එතුමාට ලැබුණු ලොකුම ගෞරවය තමයි දේහය ප්‍රාදේශීය සභාවට ගෙනාපු මොහොත.සභාපතිවරයෙක් විදියට මට සතුටුයි ඒ ගෞරවය කරන්න පුළුවන් වීම ගැන.තෙලිජ්ජවිල ප්‍රාදේශීය සභාව පිහිටවන්න වගේම මාර්ග ගැසට් කිරීම වැඩි හරියක් එතුමාගෙ කාලෙ තුළ.මුල් කාලෙ මෝටර් සයිකලයෙන් ගිහින් සේවය කලා.පසුව වාහනයක් ලැබුණ සභාවට.

අපි වෙනත් ප්‍රදේශයක මලගෙවල්වල යනකොට පෙනෙන දෙයක් තමයි පාරවල් කැළෑවෙලා වීදි පහනක් නෑ මීටර් 500කටවත් එකක්.අපේ සභාව මොන අඩුපාඩු තිබුණත් මීටර් 10ක් 20ක් ඇතුළත වීදි පහන් දාලා තියනවා.හැම මළ ගෙදරක් ගැනම දැනගත්තම මාර්ග කම්කරුවො දාලා මාර්ග වල තණකොළ කැපීම වැනි කටයුතු සිදු කරනවා.පාර සුද්ද කරනවා.වෙන සභාවල එහෙම නෑ.අද ඇල්ගිරියට කම්කරුවො යවන්න තිබුණෙ අකුරුගොඩ මළගෙදරක් තියනවා කිව්වා ඒ නිසා දෙපැත්තට දෙන්න ගානෙ යැව්වා.අබේසිංහ මහතාගෙ මරණෙ වෙලාවෙත් මං උදයසාන්ත මන්ත්‍රීතුමාගෙන් ඇහුවා මන්ත්‍රීතුමා පාරෙ බැද්ද වැව්ලද මොකද වෙන්න ඕන කියලා.එතුමා කිව්වා කපලා තියෙන්නෙ ගැටලුවක් නෑ කියලා.අපි එවැනි කාර්ය භාරයක් කරනවා.හැබැයි ඒක අගයන්නෑ.අඩුපාඩු තියනවා.ලසන්ත මන්ත්‍රීතුමා කිව්වා කිව්වා වීදි පහන් සම්බන්ධව.ඒක ඇත්ත.අපි දැනුත් උත්සාහ කරනවා සභා 3කින් හරි

ගෙනැල්ලා මේ කටයුතු ඉවර කරන්න.අපේ කම්කරු මහත්තයා අසනීප නිසා.මං අතුරලිය සභාපතිතුමාගෙනුත් අවසරය ගත්තා ඒ සභාවේ කාර්මික මහත්මයා මුදලක් දීලා සේවාව ලබා ගන්න.නීතිමය තත්ත්වය ගැන මං දන්නෑ.ලේකම්තුමිය ඒ කටයුතු සිදු කරයි මුදල් ගෙවීම සම්බන්ධව.උදයසාන්ත මන්ත්‍රීතුමාගෙන් කියවුණා දේහය ගෙනාපු එකය නිලධාරී මණ්ඩලය අකමැතියි කියලා.ඇත්තටම එහෙම දෙයක් නෙවෙයි අපි කවුරුත් දන්නවා මරණයක් ගෙදරට ගෙනාවම හත් දවසෙ බණක් කියනවා.ඒක අනිවාර්යයි.මේ වෙලාවෙ මං ළඟ මුදලක් තිබුණෙ නෑ.නැත්තම් ඒකත් කරනවා.එතකොට මානසික සුවයක් ආයතනයෙ ඉන්න හැමෝටම ලැබෙනවා.ඒ වගේම තමයි හර්ෂණී මන්ත්‍රීතුමියගෙ කතාවෙන් කියවුණා හොරකමට වංචාවට ලක් වෙච්ච පක්ෂ ගැන.මං මෙතනදි පැහැදිලිව මතක් කරනවා ඒ පක්ෂ වල අය තමයි අපි 17 දෙනාම.ඒ වුණත් අපි හන්නෙ ගමට රටට සේවයක් කරන්න.ඒ නිසා කවුරුත් ගැටුම් ඇති කරගන්නෙ නැතුව මේ කටයුත්තට සම්බන්ධ වෙන්න කියන එක මං කියනවා.මැතිවරණය තියනවද නැද්ද කියලා හෙට තමයි තීරණය ගන්නෙ සියලු දෙනාටම සුභ පතමින් නිහඬවෙනවා.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව